# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/74/2025 (NPC)

යූ.ඩබ්.කේ.කොඩිතුවක්කු,
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.05.12**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රාජ්‍ය සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

## -නියෝගය-

අභියාචක යූ.ඩබ්.කේ.කොඩිතුවක්කු යන අය විසින්, 2025.06.05 දිනැතිව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිපත් කර ඇති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත නිකුත් කර ඇති සේවය අතහැරයාමේ නියෝගය ඉවත් කර, නැවත සේවයේ පිහිටුවන ලෙසට නියෝගයක් ලබාදෙන ලෙසටයි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට අවධානය යොමු කරන ලදි. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සළකා බැලූ එකී කොමිෂන් සභාව ඔහුගේ අභියාචනය නිෂ්ප්‍රභ කරමින්, ඒ බව අභියාචක වෙත 2025.05.05 දිනැති ලිපිය මගින් දන්වා ඇත. එම ලිපියේ IV ඡේදයේ සඳහන් කර ඇත්තේ, අභියාචක විසින්

අනියම් සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම හේතුවෙන්, විනය විරෝධී ලෙස කටයුතු කර ඇති නිලධාරියෙකු ලෙස සළකා චෝදනා පත්‍රයක් ලබා තිබීමත්, මීට පෙර අවස්ථාවකදී තනතුර අතහැර යාමේ නියෝගයක් ලබා තිබීමත් යන හේතු දෙක මත, ඔහුගේ අභියාචනය නිෂ්ප්‍රභ කරන බවයි. අනියම් සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් ලබාදී ඇති බව දෙපාර්ශවයම විසින් පිළිගන්නා නමුත්, එම චෝදනා පත්‍රයට අනුව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොමැත. එයට හේතුව වී ඇත්තේ, එම අවස්ථාව වන විට, අභියාචක සේවය හැරගිය අයෙකු ලෙස සළකා සේවයේ නොසිටීම හේතුවෙනි. එවැනි අන්දමට චෝදනා පත්‍රයක් ලබා දීම පමණකින්, එය යම්කිසි පුද්ගලයෙකු සම්බන්ධයෙන් වන විනය කරුණක් ලෙස සළකා ක්‍රියා කිරීම නිවැරදි නොවේ.

කෙසේ වෙතත්, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමේ සඳහන් කර ඇත්තේ, ඔහු වෙත ප්‍රථමයෙන් නිකුත් කර තිබූ සේවය අතහැරයාමේ නියෝගය පොලිස්පතිතුමා විසින් ඉවත් කර, ඔහුව නැවත සේවයේ පිහිටුවා තිබූ බවත්, එසේ නැවත සේවයේ පිහිටුවා ඇත්තේ පොලිස්පතිතුමාගේ අත්සන සහිතව නිකුත් කරන ලද RTM **243** දරණ **2022.03.09** දිනැති දැනුම්දීම පරිදි වන බවත්ය. එම දැනුම්දීම අභියාචක එවකට පදිංචිය පවත්වා ගෙන ගොස් තිබූ බිරිඳගේ නිවසට භාරදී ඇති බව අභියාචක පවසා ඇත. එම කරුණ අභියාචකගේ දැනුමට ලක්වීමෙන් අනතුරුව, ඔහු විසින් විනය හා කල්ක්‍රියා කොට්ඨාශයෙන් විමසන ලදුව, කෑගල්ල කොට්ඨාශයට ස්ථානමාරු කර ඇති බවට ඔහුට දැනුම් දුන් බවට ඔහු පවසා ඇත. ඒ අනුව කෑගල්ල කොට්ඨාශයේ රාජකාරී වාර්තා කිරීම සඳහා ගිය අවස්ථාව වන විට ඔහුට නැවත වරක් සේවය හැරයාමේ නියෝගයක් නිකුත් කර ඇති බවට දැනුම් දුන් බව, අභියාචනා පෙත්සමේ සඳහන් කර ඇත. කෑගල්ල කොට්ඨාශය මගින් අභියාචක වෙත දෙවන වරටත් සේවය අතහැරයාමේ ලිපියක් නිකුත් කර ඇති බව අභියාචකට දැන ගැනීමට ලැබී ඇත්තේ සේවයට වාර්තා කිරීමට ගිය අවස්ථාවේ දීය. ඒ අනුව කෑගල්ල පොලිස් අධිකාරී කාර්යාලය මගින් දෙවන වරට නිකුත් කරන ලද සේවය අතහැරයාමේ නියෝගය ඔහු විසින් ලබාගත් බවට අභියාචක විසින් කරුණු ඉදිරිපත් කර ඇත. එම නියෝගයට එරෙහිව කරන ලද අභියාචනය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මෙම අභියාචනය අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇත.

ඉහත කරුණු නොසළකා හැරීමට හේතුවක් නැත. එම තත්ත්වය ජාතික පොලිස් කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කරන්නේ ද නැත. ඉහත කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ අභියාචක වෙත දෙවන වරට නිකුත් කරන ලද සේවය අතහැරයාමේ නියෝගය, නිකුත් කර ඇත්තේ අභියාචකගේ වරදක් හේතුවෙන් නොවන බවයි. මෙම තත්ත්වය වැඩිදුරටත් තහවුරු කර ගැනීම සඳහා, අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද 2024.03.10 දිනැති අභියාචනයේ අවසාන ඡේදයට පෙර ඡේදයේ සඳහන් කරුණු වලට විනිශ්චය අධිකාරයේ අවධානය යොමු විය. එහි සඳහන් කර ඇත්තේ, ඔහුගේ බිරිඳ, ඔහු සමග දැඩි වෛරයකින් පසුවූ බවත්, ඒ අනුව ඇය විසින් ගිනිගත්හේන පොලිස් ස්ථානය වෙත අභූත චෝදනා එල්ල කර, ප්‍රකාශයක් ලබාදී ඇති බවයි. එයින් පෙනී යන්නේ මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමේ සඳහන් කරුණු, මුල සිටම අභියාචක විසින් ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන ගොස් ඇති බවයි. එවැනි තත්ත්වයක් යටතේ එම කරුණු අසත්‍ය බවට තීරණය කළ නොහැකිය.

ඉහත කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ, අභියාචකගේ වරදකින් තොරව ඔහු වෙත නිකුත් ඇති 2022.07.04 දිනැති සේවය අතහැරයාමේ නියෝගය ඉවත් කිරීමට තීරණය කරමු.

කෙසේ වෙතත් මෙම අවස්ථාවේ දි ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින මාලා බස්නායක මහත්මියගෙන් විමසන ලදුව ඇය දන්වා සිටින්නේ, පොලිස්පතිතුමා වෙතින් ඔහුගේ පසුබිම් වාර්තාවක් කැඳවා ඇති බවත්, ඒ අනුව පොලිස්පතිතුමා විසින් එවා ඇති 2025.02.21 දිනැති පසුබිම් වාර්තාව අනුව 2024.10.04 දින දක්වා පසුබිම් වාර්තාවක් ලබාගෙන ඇති බවත්, එම පසුබිම් වාර්තාවෙහි අභියාචක සම්බන්ධයෙන් කිසිදු දෝෂයක් හෝ අපරාධ චෝදනාවක් එල්ල වී ඇති බවට සඳහනක් නොමැති බවට වාර්තා කර ඇති බවයි.

ඒ අනුව අභියාචක වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවීමට නියම කරමු.

එසේ නැවත සේවයේ පිහිටුවීමට පෙර, නැවත වරක් පසුබිම් වාර්තාවක් ලබාගත යුතු බවටත්, එම වාර්තාව යහපත් වාර්තාවක් වන්නේ නම් පමණක් නැවත සේවයේ පිහිටුවන ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාවට වැඩිදුරටත් දැනුම් දෙමු.

මෙම නියෝගය හේතුවෙන් අභියාචක වෙත කිසිදු හිඟ වැටුපක් හෝ වෙනත් කිසිදු දීමනාවකට අයිතිවාසිකම් නොලැබෙනු ඇත.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචකගේ ඉල්ලීමට අවසර ලබා දෙමු.

අභියාචනයට අවසර ලබා දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-